# වරකාපොල ප්‍රාදේශීය සභාව
# ප්‍රසම්පාදන දැන්වීමයි.

2022 වර්ෂයට අවශ්‍ය වන පහත සඳහන් කාර්යාලීය ලිපිද්‍රව්‍ය මිලදීගැනීම සඳහා මිල ගණන් අප වෙත ලැබීමට සලස්වන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

- **කලු පැන්**
- **බොක්ස් ෆයිල්**
- **පුස්තකාල අවවාද පත්‍රිකා**
- **පුස්තකාල බැහැරදෙන පත්‍රිකා**
- **වැය ලේඛන**
- **සභා වාර්ථා අලවන පොත්**
- **රෝගීන් පැමිණීමේ නාමලේඛන**
- **වැටුප් ලේඛන**
- **ප්‍රධාන ලෙජර**

02. 2022 වර්ෂයට වරකාපොල බල ප්‍රදේශයේ සභාව සතු ග්‍රාමීය මාර්ගවල ජලය බැස යන ස්ථාන සඳහා යෙදීමට අවශ්‍ය බෝක්කු බට, දිග අඩි 4 විශ්කම්භය අඩි 1 සහ දිග අඩි 4 විශ්කම්භය අඩි 1 ½ ප්‍රමාණයෙන් මිලදීගැනීම සඳහා මිල ගණන් අප වෙත ලැබීමට සලස්වන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

03. සියලුම මිල ගණන් ලියාපදිංචි තැපෑලෙන් සභාපති, "ප්‍රාදේශීය සභාව, වරකාපොල" ලිපිනයට එවීම හෝ එම ලිපිනයේම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ගෙනවිත් **2022.12.08 දින පෙ.ව. 10.00 ට පෙර** බහළීමට කටයුතු කළ යුතුය. ටෙන්ඩරය විවෘතකිරීම **2022.12.08 දින පෙ.ව. 10.30** ට සිදුකරනු ලැබේ.

04.මිල ගණන් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"2022 වර්ෂයට අවශ්‍ය (*ලිපිද්‍රව්‍ය/බෝක්කු බට*) සඳහා මිල ගණන්"** ලෙස අදාල පරිදි සඳහන් කළ යුතුවේ.

05. අවශ්‍යතාවය නිසි පරිදි දැන් වූ පසු මිලගණන් ඉදිරිපත්කිරීමට අපොහොසත් වන හෝ ඇණවුම්කිරීමෙන් පසු නියමකරන කාලය තුල දී සැපයීමට අපොහොසත් වන හෝ සිය සැපයුම් අදාල පිරිවිතර හා නියදිවලට අනුකූල නොවනවිට අදාල සැපයුම්කරුවන් අසාදුලේඛන ගත කරනු ලැබේ.

06. භාණ්ඩ සඳහා ඔබ විසින් ඉදිරිපත්කරන මිල ගණන් කාර්තු2ක් (මාස 6ක්) සඳහා ප්‍රමාණවත් විය යුතු අතර ඔබ විසින් සපයන භාණ්ඩ හා සේවාව ඉහළම ගුණත්වයකින් පැවතිය යුතුබව මෙයින් දන්වා සිටිමි.

07. සියලුම ටෙන්ඩර් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ටෙන්ඩර් මණ්ඩලය සතු වේ.

08. 035-2267775/275 යන දුරකථන අංකයට අමතා වැඩි විස්තර ලබාගත හැකිය.

**2022.11.10**

එන්.සරත් සුමනසූරිය
සභාපති
ප්‍රාදේශීය සභාව ,වරකාපොල

වරකාපොළ ප්‍රාදේශීය සභාව
வரகாபொல பிரதேச சபை
Warakapola Pradeshiya Sabawa